# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,921/6 — 1970 සැප්තැම්බර් 4 වැනි සිකුරාදා — 1970.9.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි පැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 270/2

එල්.ඩී.—බී. 88/48

අ. ආ. කා. අංක සී. 314/70 (2)

### 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාවේ 49 (3) වැනි වගන්තිය යටතේ නිවේදනය යි.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති ලංකාවෙන් බැහැර යාම නිසා ඇයට ලංකාවේ දී එම ධූරයෙහි කටයුතු කිරීමට නො හැකි හෙයින් :

අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ 49 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති පෙරළා ලංකාවට පැමිණෙන තෙක් රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති ලෙස ලංකාවෙහි දී වැඩ බැලීමට වාරිමාර්ග, විදුලිබලය හා මහා මාර්ග ඇමති මෙයින් පත් කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා,

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය,
කොළඹ, 1970 සැප්තැම්බර් 4 වැනි දින,

9—475

---

1970 අංක 270/3

අ.ආ.කා. අංකය : සී. 314/70 (2)

1946 හේ හා 1947 හේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 46 වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරතුමා පහත සඳහන් පත්කිරීම් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ :—

| | |
|---|---|
| (1) ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ගරු ඇමතිනියගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, රත්න දේශප්‍රිය සේනානායක මහතා | ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ඇමතිනි, පාර්ලිමේන්තු මන්ත්‍රිනී, ගරු සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිණිය දිවයිනට පෙරළා පැමිණෙන තුරු, ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ඇමති ධූරයෙහි වැඩ බැලීමට. |
| (2) විදේශිය හා දේශිය වෙළඳ ගරු ඇමතිතුමන්ගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, පහළ රාල්ලාගේ රත්නායක මහතා, | විදේශිය හා දේශිය වෙළඳ ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ටිකිරි බණ්ඩා ඉලංගරත්න මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, විදේශිය හා දේශිය වෙළඳ ඇමති ධූරයෙහි වැඩ බැලීමට. |
| (3) රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ගරු ඇමතිතුමන්ගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, විලියම් නීල් ද අල්විස් මහතා, | රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ධූරයෙහි වැඩ බැලීමට. |

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේ දී ය.

9–480

652/11 — —රජ 16574 –10,725 (70/9)

# ආණ්ඩුවේ නිවේදන

## මහාජන ආරක්ෂක ආඥාපනත

(40 වෙනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතෙහි 5 වෙනි වගන්තිය යටතේ මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, මා ලංකාවෙන් බැහැරව සිටින කාලය තුළ ඉහත කී 5 වෙනි වගන්තිය යටතේ මා වෙනුවෙන් වැඩ බැලීමට වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමතිට මෙයින් බලය පවරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1970 සැප්තැම්බර් මස 4 වෙනි දින,
කොළඹ දී ය.

9–476/1

---

## 1946, ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාව

### 47 (2) වෙනි වගන්තිය යටතේ නිවේදනය යි

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවෙහි 47 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදෙශ කටයුතු පිළිබඳ අමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, 1959 අංක 8 දරන පනතින් සංශෝධිත (40 වැනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ III වැනි කොටසින් මා වෙත පැවරී ඇති හෝ නියමව ඇති සියලු බලතල හා යුතුකම්, මා ලංකාවෙන් බැහැර සිටින කාලය තුළ, මාගේ පාර්ලිමේන්තු ලේකම් ජයකොඩි ආරච්චිගේ ලක්ෂ්මන් ජයකොඩි මහතා වෙත මේ නිවේදනයෙන් පවරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදෙශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1970 සැප්තැම්බර් මස 4 වෙනි දින,
කොළඹ දී ය.

9–476/1

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතියේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.